**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2017**

**-----------------------------------------------------------------**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1998 අංක 5 දරන පනතින් සංශෝධිත (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතෙහි 213 “අ” වගන්තිය හා 237 වගන්තිය යටතේ පළකල 2005 අප්‍රේල් 04 දිනැති රජයේ ගැසට් පත්‍රය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2018 මැයි 23 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

**-------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

භාණ්ඩාගාර බිල්පත් අංක 09 යෙහි සමාලෝචිත වර්ෂයට අදාළ පොළී ආදායම රු.6,944,578 ක් වුවද එය රු.7,408,228 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ පොළී ආදායම රු.463,650 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | ආදායම් බදු පනතට අනුව සභාව බදුවලින් නිදහස් කර නොතිබුණු බැවින් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී උපයා තිබූ රු. 62,775,604 ක ආදායම බදු වලින් නිදහස් කර ගැනීමට හෝ ආදායම් බදු සඳහා ලියාපදිංචි වී බදු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රෙගුලාසි ප්‍රකාරව කිසියම් මාණ්ඩලික නිලධාරියෙකුට දෙනු ලබන අතුරු අග්‍රිමයක්, අදාළ කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවද, 2017 වර්ෂය තුල සභාව විසින් වැඩසටහන් පැවත්වීම හා අනෙකුත් වියදම් සඳහා දෙනු ලැබූ රු. 179,813 ක අත්තිකාරම්, කාර්යය අවසන් වී දින 10 සිට දින 90 ක කාල පරාසයක් ප්‍රමාද කර පියවීම් කර තිබුණි. |
| **(ඇ)** | 2004 නොවැම්බර් 24 දිනැති අංක 1368/18 දරන ගැසට් නිවේදනයේ 02 වගන්තියේ ආකෘති පත්‍ර අංක 01 | තුන්වන පාර්ශව රක්ෂණ වටිනාකම් පිළිබඳව NCRS Form 01 පත්‍රිකාවෙන් තොරතුරු සැපයීමේ දී තුන්වන පාර්ශව රක්ෂණ වටිනාකම හඳුනාගත හැකි පරිදි තොරතුරු දක්වා නොතිබීම නිසා ආයතන 03 කින් සමාලෝචිත වර්ෂයේ ප්‍රේෂණය කරන ලද රු.14,079,626 ක මුදලෙහි නිවැරදිතාවය පිළිබඳ විගණනයේ දී තහවුරු නොවීය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.44,959,713 ක අතිරික්තයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.39,654,832 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,304,881 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව වියදම රු. 4,502,383 කින් වැඩි වුවද රක්ෂණ ආදායම් දායකත්වය රු. 4,904,394 කින් එනම් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 13 කින් වර්ධනය වීම හා ස්ථාවර තැන්පතු පොළී ආදායම සහ භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම රු. 4,902,871 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 03 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී ආයතනයේ අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවතිණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2014 වර්ෂයේදී රු. 28,736,208ක් වූ සභාවේ දායකත්වය 2017 වර්ෂයේදී රු. 47,426,273 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

වාර්ෂික අයවැය ලේඛනය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවද අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබූ රු. මිලියන 4.6 ක් වූ වැඩසටහන් 03 ක් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ අතර අයවැය ලේඛනයේ ඇතුලත් කර තිබූ රු.මිලියන 1.5 ක් වටිනාකම වූ වැඩසටහන් 02 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපිත කර තිබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා වසර 20 ක් ගත වී ඇතත් පනතේ සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

- සෑම වසරකම මාර්ග ජාලයට අලුතින් එකතු වන මාර්ග සම්බන්ධව හා රථ වාහන ප්‍රමාණය මාර්ග අනතුරු, දේපල හානි හා සම්බන්ධ සියළු තොරතුරු ඇතුලත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම.
- සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම, පර්යේෂණ පැවැත්වීම, ක්ෂේත්‍ර පරීක්ෂණ පැවත්වීම සහ ආධාර කිරීම.
- මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් දීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබාදීම.

- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුල මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යය සම්බන්ධීකරණය කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(i)** **<u>නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම</u>**.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිසමක් බවට පත් කිරීම සඳහා වූ නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු මගින් රු. 220,000 ක් වෙන්කර දී තිබුණ ද කොමිෂන් සභා පනත සම්මත කර ගැනීම, කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීම, කොමිෂන් සභාව ස්ථාපිත කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා පුවත්පත් දැන්වීමක් පළ කිරීම යන කාර්යයන් ඉටු කර නොතිබුණි.

**(ii)** **<u>රක්ෂණ අරමුදල් දායකත්වය වැඩි කර ගැනීම.</u>**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රක්ෂණ නියෝජිත ආයතන වලින් ලැබෙන සියයට 01 ක් වන රක්ෂණ ආදායම සියයට 02 දක්වා වැඩි කර ගැනීමට අරමුණු කළද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(iii)** **<u>පර්යේෂණ හා සමීක්ෂණ</u>**

පර්යේෂණ හා සමීක්ෂණ වැඩසටහන් අතර මාරක රිය අනතුරුවලට හේතු සෙවීම සඳහා පර්යේෂණ හා සමීක්ෂණ පැවත්වීම, ඒ සඳහා ආයතන තෝරා ගැනීම සහ ඒ මත ඉදිරිපත් කරන වාර්තාව අනුව අනතුරු අවම කර ගැනීමට කටයුතු කිරීම 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන කාර්යභාරයක් වුවද 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදු වූ මාරක රිය අනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 2590 ක්, 2824 ක් හා 2924 ක් වශයෙන් ක්‍රමිකව වර්ධනය වී තිබුණි. පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් රු. 500,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර දී තිබුණ ද එය වර්ෂය තුල භාවිතා කර නොතිබුණි.

**(iv)** **<u>මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>.**

අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා දැනුවත් කිරීම් පුවරු 250 ක් සවි කිරීම වෙනුවෙන් රු. මිලියන 04 ක් වෙන් කර දී තිබුණ ද වර්ෂය තුල අනාරක්ෂිත දුම්රිය ස්ථාන හඳුනාගැනීම් හෝ පුවරු සවිකිරීම සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී දුම්රිය හරස් මාර්ග වල සිදු වූ අනතුරු සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| | සංඛ්‍යාව | තුවාල | මරණ |
|---|---|---|---|
| වාහන දුම්රියේ ගැටීම් | 86 | 59 | 12 |
| වාහන හරස් මාර්ග ගේට්ටුවල ගැටීම් | 439 | - | - |

**(v)** **<u>පුහුණුව හා නිවාරණය</u>**

මාර්ග අනතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා පවත්වන පුහුණු හා නිවාරණ වැඩසටහන් යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම් 03 ක් සඳහා රු.1,200,000 ක් වෙන් කර දී තිබුණි. එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(vi) <u>මාධ්‍ය හා විද්‍යුත් ආවරණ කටයුතු පුළුල් ලෙස බලගැන්වීම.</u>
සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණු මාර්ග ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය හා විද්‍යුත් ආවරණ සඳහා වූ ක්‍රියාකාරකම් 06 ක් සඳහා රු. 10,400,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. 2017 වර්ෂය අවසාන වන විට එම ක්‍රියාකාරකම් 06 සඳහාම රු. 4,100,829 ක් පමණක් වැය කර තිබුණු අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 39 කි.

(vii) <u>අන්තර්ජාල පහසුකම් සහිත පුස්තකාලයක් පවත්වාගෙන යාම.</u>
මෝටර්රථ වාහන පනත යටතේ ස්ථාපිත කර තිබු මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ප්‍රධාන කාර්යයක් ලෙස අන්තර්ජාල පහසුකම් සහිත පුස්තකාලයක් පවත්වාගෙනයාමට අරමුණු කර තිබුණ ද සභාව පිහිටුවා වසර 20 ක් ගත වී ඇතත් පුස්තකාලයක් පිහිටුවා නොතිබුණි.

(ඇ) එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් 2011 – 2020 කාලපරිච්ඡේදය දක්වා නම් කරන ලද මාර්ග ආරක්ෂණ දශකයට සමගාමීව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් 2011 මැයි 11 දින පැවති මාර්ග ආරක්ෂණ සමුළුවේදී පහත සඳහන් අයිතම 05 ක් යටතේ ඉදිරිපත් කරන ලද දේශීය සැලසුම් 2018 මාර්තු 31 දින වන විටත් ක්‍රියාවට නංවා නොතිබුණි.

(i) මාර්ග ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම
(ii) ආරක්ෂක මාර්ග පද්ධතියක් ඇති කිරීම.
(iii) වාහන වල ගුණාත්මක බව වර්ධනය කිරීම.
(iv) මාර්ගය භාවිතා කරන්නන්ගේ විනය ඇති කිරීම
(v) අනතුරකින් පසු ප්‍රතිකර්ම. (හඳුනා නොගත් වාහන අනතුරු සඳහා වන්දි ගෙවීම හා ජාත්‍යන්තර වින්දිතයන්ගේ දිනය සැමරීම)

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත අතිරික්ත මුදල් ආයෝජනය කළ හැකිය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් සංසන්දනය කිරීමේ දී සෑම මසකම රු. මිලියන 2.12 ක පමණ අතිරික්ත මුදලක් ආයෝජනය කිරීමට හැකියාව සභාව සතුව පැවතුණ ද අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට අවධානය යොමු වී නොතිබුණි. තවද සභාවේ ජංගම ගිණුමේ 2017 ජනවාරි 01 දිනට පැවති රු. මිලියන 43 න් රු. මිලියන 40 ක් අයෝජනය කිරීම සඳහා 2017 මාර්තු 24 දින සභා පත්‍රිකා අංක 2017-06-07-02 මගින් ජාතික සභාවේ අනුමැතිය ලබා දී තිබුණි. 2018 අප්‍රේල් 10 දින වන විටත් එහි මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. එම මුදල් අතිරික්තය සඳහා වසරක කාල සීමාව තුල අනුමැතිය ලබා නොගැනීම හා ආයෝජනය නොකිරීම නිසා සියයට 11 ක සාමාන්‍ය වාර්ෂික පොළී අනුපාතයක් යටතේ රු. මිලියන 4.4 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) දකුණු ආසියානු කලාපය තුල පවතින රටවල් 10 න් වැඩිම අනතුරු සංඛ්‍යාවක් සිදුවන රටවල් අතුරින් 03 වන ස්ථානය ශ්‍රී ලංකාවට හිමිව තිබූ අතර (ජනගහනය ලක්ෂයකට තායිලන්තය 36.2, මියන්මාරය 20.3, ශ්‍රී ලංකාව 17.4) මෙම අනුපාතය අවම කර ගැනීමට අපේක්ෂිත සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1998 අංක 05 දරන මෝටර් රථ වාහන (සංශෝධන) පනතේ 2.13.B වගන්තිය ප්‍රකාරව හඳුනා නොගත් වාහනවලින් අනතුරට ලක් වූ පුද්ගලයන්ට වන්දි ගෙවීම සභාවේ ප්‍රධාන අරමුණක් වුවද, 2016 වර්ෂය තුල හඳුනා නොගත් වාහන වලින් සිදු වූ මාර්ග අනතුරු 201 කින් ලැබුණු වන්දි අයදුම්පත් ප්‍රමාණය 88 ක් වූ අතර 2017 වර්ෂයේ දී සිදු වූ මාර්ග අනතුරු 175 කින් ලැබුණු වන්දි අයදුම්පත් 48 ක් විය. හඳුනා නොගත් වාහන වලින් සිදුවන අනතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දරන ලද වියදම 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී සියයට 4,793 කින් වැඩි වී තිබුණ ද 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ වන්දි අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) සභාව විසින් මාර්ග භාවිතා කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා 2013 වර්ෂයේ සිට (2016 හැර) 2017 වර්ෂය දක්වා දරා තිබූ වියදම ක්‍රමිකව වැඩිවීමක් දක්නට ලැබුණි. නමුත් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මාරක හා බරපතල රිය අනතුරු ප්‍රමාණය 9,060 සිට 11,068 දක්වා වාර්ෂිකව ක්‍රමිකව වැඩි වී තිබුණි. තවද 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අනතුරුවලින් මියගිය ප්‍රමාණය 2,362 සිට 3,101 දක්වා ක්‍රමික වැඩිවීමක් දක්නට ලැබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා හඳුනා නොගත් වාහන වලින් සිදුවූ අනතුරු හේතුවෙන් ලැබී තිබුණු වටිනාකම රු. 4,900,000 ක් වූ වන්දි අයදුම්පත් 37 ක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ දින සිට 2018 මාර්තු 31 දිනට වර්ෂ 1 මාස 03 සිට වර්ෂ 03 මාස 03 ක කාලයක් ගත වී ඇතත් වන්දි ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මරණ හා තුවාලකරුවන් 48 ක් වෙනුවෙන් ලැබී තිබූ රු. 6,600,000 ක් වටිනා වන්දි අයදුම්පත්‍ර අතුරින් වර්ෂය තුලදී මරණ අයදුම්පත් 02 ක් හා තුවාලකරුවන් 03 දෙනෙකු වශයෙන් අයදුම්පත් 05 ක් සඳහා රු. 700,000 ක් පමණක් වන්දි වශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ලැබූ අයදුම්පත්‍ර ප්‍රමාණයට සාපේක්ෂව සියයට 10.4 ක අඩු ප්‍රතිශතයක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව පිහිටුවා වසර 20 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

--------------------------

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම.

----------------------------------------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු වන නිරෝගීබව හා යහ පැවත්ම හඳුනා ගෙන තිබුණ ද ඒ සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තිරසාර ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර තිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේ දී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------------

### 6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර සභාව විසින් අනුමත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛනය සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසාගෙන නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී සභාවේ සාමාජිකයන්ගේ දීමනා ලෙස රු.1,877,239 ක් ගෙවා තිබුණි.

### 6.3 සමාජ වගකීම් ඉටු කිරීම.

-----------------------------------

මහා මාර්ගවලදී සිදුවන රිය අනතුරු තුලින් ජීවිත හානි, දේපළ හානි මෙන්ම විවිධ පාරිසරික ගැටළු නිර්මාණය වන අතර එම අනතුරු හේතුවෙන් සමාජයට වැඩදායී පුද්ගලයින් හා ඔවුන්ගේ සේවය අහිමිවීමත් ඔහු වෙනුවෙන් සමාජය මඟින් ඉටු කල යුතු වගකීම් ප්‍රමාණය ඉහල යාමත් තුලින් රජයට දැරීමට සිදුවන පිරිවැය ඉහල යන අතර එය රටේ ආර්ථික වර්ධනයට බලපෑමක් ඇති කරයි. මේ අනුව මාර්ග අනතුරු වලින් තොර සමාජයක් බිහි කිරීමේ මෙහෙවර යටතේ පිහිටුවන ලද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2017 වර්ෂයේ සැලසුම් හා කාර්යසාධනය සම්බන්ධයෙන් පරීක්ෂාවේදී ආයතනය මඟින් ඉටුවිය යුතු සමාජීය වගකීම ප්‍රමාණවත් පරිදි සම්පූර්ණ වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| **(අ)** | ආදායම් රැස්කිරීම | රක්ෂණ ආයතන වලින් ලැබෙන ආදායම නිවැරදි බවට තහවුරු කර නොගැනීම. |
| **(ආ)** | වන්දි ගෙවීම | ප්‍රමාදයකින් තොරව වන්දි ගෙවීමට කටයුතු නොකිරීම. |
| **(ඇ)** | සැලසුම් කිරීම හා අයවැය පාලනය | වාර්ෂික අයවැය ලේඛනය පදනම් කර ගත් ක්‍රියාකාරී සැලැස්මක් අනුව කාර්යසාධනය ඉටු නොකිරීම. |
| **(ඈ)** | පොත්පත් හා ලේඛන පැවැත්වීම | සභාව විසින් මිලදී ගෙන තිබූ බහුකාර්ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ එකෝ යන්ත්‍ර ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් නොකිරීම. |